**අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (AIUDP) - 2023**

----------------------------------------------------------------------------------------

අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ (AIUDP) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හා සංවර්ධනය සඳහා වන ප්‍රංශ නියෝජිතායතනය අතර 2016 දෙසැම්බර් 01 දින එළඹි (2017 අගෝස්තු 31, 2018 මැයි 14 හා 2021 මාර්තු 14 යන දිනයන්ගෙන් සංශෝධිත) CLK – 100901 R අංක දරන ණය ගිවිසුමේ 3.4.3 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව**

ණය පහසුකම් ගිවිසුම අනුව, නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර එය නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන (SCDP) යටතේ ක්‍රියාත්මක වේ. අනුරාධපුර නගරයේ පූජනීය සහ නූතන කොටස අතර සමතුලිත සම-සංවර්ධන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම වන අතර, එහි සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂා කිරීම හා මෙය ප්‍රධාන ආකර්ශනීය සථානයක් බවට පත්කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 10,025.18 කට සමාන යූරෝ මිලියන 62.4 ක් වන අතර ඉන් රු.මිලියන 8,354.32 කට සමාන යූරෝ මිලියන 52ක් සැපයීමට සංවර්ධනය සඳහා වන ප්‍රංශ නියෝජිතායතනය (AFD) එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 1,670.86 ක මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ කටයුතු 2016 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර, 2021 දෙසැම්බර් 31 දින වන විට නිමකිරිමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සංශෝධිත ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2023 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය යන කොටස් විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, 2023 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩුව/ විගණන නිරීක්ෂණය | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| උතුරු බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් අවලංගු කිරීම හේතුවෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 45.9ක් ව්‍යාපෘතියට ආපසු ගෙවිය යුතුය. කෙසේ වෙතත්, එය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 45.9 | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂයන් හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

**2.2 නීති,රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම්**

| | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| ( අ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 ජාතික අයවැය චක්‍රලේඛයේ (iii) ඡේදය. | ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 (iii) ඡේදයේ "අර්ධ වශයෙන් නිම කරන ලද යටිතල පහසුකම් සංවර්ධනය අත්හිටුවීමේ දී එම යටිතල පහසුකම් භාවිතා කරන්නන්ට ඇතිවන අපහසුතාවය අවම වන පරිදි හා දිගුකාලීන පැවැත්ම තහවුරු වන පරිදි අවශ්‍ය කොටස් සම්පූර්ණ කළ යුතුය" යනුවෙන් දක්වා ඇති උපදෙස්වලට පටහැනිව මෙම ව්‍යාපෘතිය අමාත්‍යාංශය විසින් නවතා දමා තිබුණි. | විචලතාවයන් සහ අනෙකුත් තාක්ෂණික ගැටළු නිවැරදි කිරීමට දැන් කටයුතු කරමින් පවතී. වර්තමානයේදී කොන්ත්‍රාත්කරුවන්ගේ හිමිකම් ඇගයීමට ලක් කරමින් පවතී. | ඉතිරි වැඩ කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 ඡේදය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 8.13.4 අනුව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශවලට යටත්ව සියයට 10ක් දක්වා ශුද්ධ විචලනය අනුමත කළ හැක..<br>කෙසේ වෙතත්, ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් මාර්ගෝපදේශයට පටහැනිව සියයට 28.4 ක විචලනයන් අනුමත කර තිබුණි. | ජාතික මෙහෙයුම් මැදිරිය විසින් මේ වන විට ආරම්භ කරන ලද ව්‍යාපෘතිය නිම කිරීමට අනුමැතිය ලබා දී ඇත. මෙම අනුමැතියත් සමඟ ව්‍යාපෘතිය විසින් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ඇතිව දැනට පවතින ව්‍යාපෘතිය නැවත ඇගයීමට ලක් කර ඇති අතර වෙනස්කම් සහ අනෙකුත් තාක්ෂණික ගැටළු නිවැරදි කිරීමට දැන් කටයුතු කරමින් පවතී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිලිබඳ භෞතික ප්‍රගතිය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| අ) | ණය පහසුකම් ගිවිසුමට අනුව 2021 අවසන් වන විට ව්‍යාපෘතියේ රු.මිලියන 6,562.68 ක් වටිනා පැකේජ 12 ක ප්‍රසම්පාදන සම්පූර්ණ කර තිබිය යුතුය. කෙසේ වෙතත්, රු. මිලියන 5,025ක් | ඉතිරි වැඩ රජය විසින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියෙන් පසුව තීරණය කළ යුතුය. | ව්‍යාපෘති කාල සීමාව තුළ වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වටිනා පැකේජ 07 ක ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. ණය පහසුකම 2023 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණු අතර, ව්‍යාපෘති කාලසීමාව තුළ නිම කිරීමට අපේක්ෂිත වැඩ ව්‍යාපෘති කාලය අවසන් වන විට සම්පූර්ණයෙන් නිම කිරීමට නොහැකි වූ බව තවදුරටත් නිරීක්ෂණය විය. | | |
| ආ) | ව්‍යාපෘතිය යටතේ සිදුකිරීමට අපේක්ෂිත පැකේජ 12 න් රු. මිලියන 2,123.19 ක් වටිනා පැකේජ 05 ක් පමණක් ආරම්භ කර තිබූ අතර 2022 දෙසැම්බර් 31 දින වන විට  අවසන් කර තිබුණේ පැකේජ 2 ක් පමණි. 2023 වර්ෂයේදී මාස 04 සිට 07 දක්වා ප්‍රමාදයකින් පසුව අංක 3 සහ 4 පැකේජ නිම කරන ලද අතර ඒ සඳහා  ප්‍රධාන වශයෙන් දුර්වල ඉදිකිරීම් අධීක්ෂණය සහ සැලසුම් හා නිර්මාණ කිරීමේ දුර්වලතාවය බලපා තිබුණි. | ආර්ථික අර්බුද, ද්‍රව්‍ය නොමැතිකම සහ මූලික සැලසුම්කරණය සහ සැලසුම් නිර්මාණ උපදේශනයේ ඇති දුර්වලතා ප්‍රමාදයට ප්‍රධාන හේතුවයි. | වැඩ කඩිනම් කිරීම සඳහා නිවැරදි පියවර ගත යුතුය. |
| ඇ) | අනුරාධපුර දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය 2022 පෙබරවාරි 24 වන දින ආරම්භ කරන ලද අතර 2023 නොවැම්බර් 25 වන දින මාස 21ක් ඇතුළත නිම කිරීමට අපේක්ෂා කරන ලදී.  නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය ප්‍රංශ නියෝජිතායතනයේ (AFD) සහ මහා භාණ්ඩාගාරයේ තීරණය ලැබෙන තුරු, ව්‍යාපෘතියේ වැඩ නතර කලද, (පාංශු සංරක්ෂණ කටයුතු සහ ජලාපවහන පද්ධතිය හැර) 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 243.15 ක් වැය කර තිබුණි. | විචලනයන්  සහ අනෙකුත් තාක්ෂණික ගැටළු නිවැරදි කිරීමට දැනට කටයුතු කරමින් පවතී. කොන්ත්‍රාත්කරුවන්ගේ හිමිකම් මේ වන විට ඇගයීමට ලක් කරමින් පවතී. | වැඩ සැලැස්මට අනුව වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| අ) | 2022 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘති කාර්ය මණ්ඩල සංඛ්‍යාව අඩු කර අර්ධකාලීන ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු සහ පූර්ණ කාලීන ප්‍රමාණ මිනින්දෝරුවෙකු පමණක් ව්‍යාපෘතියට සෘජුවම සම්බන්ධ වී ඇති අතර, . ව්‍යාපෘති  කාල සීමාව තුළ ඉතිරි වැඩ නිම කිරීමට ඇති හැකියාව විගණනයේදී සැක සහිත විය. එහෙත් ව්‍යාපෘතිය ඵලදායි ලෙස නිම නොකර 2016 වසරේ සිට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා රු. මිලියන 309ක මුදලක් ගෙවා තිබුණි. | 2022 සහ 2023 කාලය තුළ පැවති අවිනිශ්චිත තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති කාර්ය සාධනය ඉතා දුර්වල මට්ටමක පැවතිණි. කෙසේ වෙතත්, 2023 අගභාගයේදී ජාතික මෙහෙයුම් මැදිරියේ අනුමැතිය ඇතිව, පැකේජය 06 දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය සැලසුම් කළ පරිදි නිම කළ හැකි බව ව්‍යාපෘතිය විශ්වාස කරයි. | ව්‍යාපෘතියේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| ආ) | සුරපුර එළිමහන් රංග පීයයේ සහ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ එළිමහන් රංග පීයයේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වනතුරු ප්‍රධාන උපකරණ සහ භාණ්ඩ (ආලෝක, ආසන) සපයා නොතිබීම හේතුවෙන් එම රංගපීය භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබුණි. එබැවින් ඉදිකිරීම් සඳහා වැය කර තිබූ රු.මිලියන 331.73 ක වියදම ඉදිරියේදී නිෂ්ඵල වියදමක් විය හැකි බව විගණනයේ දී නිරීක්ෂණය විය. | අප දැනටමත් සුරපුර එළිමහන් රංග පීයය, SLBC එළිමහන් රංග පීයය අදාළ ආයතනයන්ට පවරා දී ඇති අතර දැනට ඔවුන් එහි පාලනය භාරගෙන ප්‍රයෝජනයට ගැනීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | ඉතිරි වැඩ තවදුරටත් ප්‍රමාදයකින් තොරව නිම කිරීමට උපදෙස් ලබාදිය යුතුය. |
| ඇ) | දිනකට ඝන මීටර් 35 ක ධාරිතාවකින් යුත් මලාපවාහන පිරිපහදු ඒකකයක් රු. මිලියන 30 කට ඉදිකිරීමට යෝජනා කර තිබුණු අතර අනුරාධපුර මහ නගර සභාවේ නගරාධිපතිවරයා විසින් 2022 පෙබරවාරි 10 දිනැති ලිපියෙන් කරන ලද ඉල්ලීමට අනුව එය සංශෝධනය කර දිනකට ඝන මීටර් 75 ක ධාරිතාවයකින් ඉදිකරන ලදී. තවද නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීම හා ව්‍යාපෘතියේ වැඩකටයුතු ආරම්භ කිරීමට පෙර සිටම නගරාධිපතිවරයා විසින් කරන ලද ඉල්ලීම සැලකිල්ලට නොගැනීම හේතුවෙන් විචලනයන් සිදුවී ඇති බව නිරීක්ෂණය විය. එබැවින් කොන්ත්‍රාත්තුවේ මුළු කොන්ත්‍රාත් මුදල රු. මිලියන 98.45 ක් දක්වා වැඩිවී ඇති අතර ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් විචලන නියෝගය අනුමත කර තිබුණි.<br><br>තවද, ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් රු. මිලියන 138ක විචලන නියෝගයක් ඉඩම් සකස් කිරීමේ කටයුතු, පවතින බස් නැවතුම්පොළ ප්‍රතිසංස්කරණය, පාංශු ආරක්ෂණ හා පාරිසරික කටයුතු සඳහා අනුමත කර තිබුණි. | විචලනයන් සහ අනෙකුත් තාක්ෂණික ගැටළු නිවැරදි කිරීමට දැන් කටයුතු කරමින් පවතී. කොන්ත්‍රාත්කරුවන්ගේ හිමිකම් මේ වන විට ඇගයීමට ලක් කරමින් පවතී. | වැඩ සැලැස්මට අනුව වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| ඇ) | මහාපරිමාණ සංවර්ධන ව්‍යාපෘති (RAMP) ප්‍රති-උපායගත කිරීම සහ වේගවත් කිරීම සඳහා වූ කමිටුවේ තීරණයට අමතරව ව්‍යාපෘතිය ආරම්භයේදී හඳුනා නොගත් රුපියල් මිලියන 236.85 ක් වටිනා විචලන නියෝගයක් ව්‍යාපෘතියට ඇතුළත් කර තිබුණි. | අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ඇතිව ව්‍යාපෘතිය විසින් දැනට පවතින ව්‍යාපෘතිය නැවත ඇගයීමට ලක් කර ඇති අතර, විචලනයන් සහ අනෙකුත් තාක්ෂණික ගැටළු නිවැරදි කිරීමට දැනට කටයුතු කරමින් පවතී. කොන්ත්‍රාත්කරුවන්ගේ හිමිකම් මේ වන විට ඇගයීමට ලක් කරමින් පවතී. | නිසි අනුමැතිය ලබා ගත යුතුය. |

## 3.3 නිෂ්ක්‍රීය/ උපයෝජනය නොකළ/ ඌන උපයෝජිත සම්පත්

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උතුරු බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම යටතේ වාරිමාර්ග නිල නිවාස ගොඩනැගිල්ල වෙනත් ස්ථානයකට රැගෙනයාම සඳහා වන්දි වශයෙන් රු.මිලියන 45.9 ක මුදලක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. කෙසේ වෙතත්, මෙම පැකේජය අවලංගු කිරීමෙන් පසු එම මුදල වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් අයකර ගත යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එය අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ගෙවා ඇති මුදල අයකර ගැනීමට අපි කටයුතු කරන්නෙමු. | වන්දි අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ ඉතිරි කටයුතු අවසන් කිරීම සඳහා 2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන ලෙස යුරෝ මිලියන 06 ට සමාන රුපියල් මිලියන 2,070 ක් වෙන් කිරීමට ජාතික මෙහෙයුම් මැදිරිය (NOR) තීරණය කර තිබුණද, මේ සම්බන්ධයෙන් ණය ප්‍රදානකරු සමඟ ගිවිසුමක් ඇති කර ගෙන නොතිබුණි. තවද මෙම වියදම ඉදිරියේදී ශ්‍රී ලංකා රජයට වැය බරක් වනු ඇති බව නිරීක්ෂණය විය.<br><br>ඒ අනුව, ව්‍යාපෘතිය රජයේ අරමුදලින් රු.මිලියන 129 ක් ඉදිකිරීම් සඳහා වැය කර ඇති අතර 2024 අප්‍රේල් 30 වන විට සියයට 38 ක අඩු භෞතික ප්‍රගතියක් ලබාගෙන තිබුණි. | ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියෙන් පසු වෙන්කරන ලද රු. මිලියන 2,070 න් යුරෝ මිලියන 6ක් ණය ප්‍රදානකරුගෙන් ලබා ගැනීම සඳහා රජයට අවබෝධයක් ඇත. පැකේජය 06 පසුගිය කාලය තුළ මුහුණ දුන් මූල්‍ය බාධාවන් සහ අනෙකුත් බාධාවන් හේතුවෙන් සියයට 38 ප්‍රගතියක් දැනට ලබාගෙන ඇත. | ණය ප්‍රදානකරුගෙන් කැමැත්ත ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2016 වර්ෂයේ ඇති කර ගත් ණය ගිවිසුමට අනුව රු. මිලියන 8,354.32 ක අරමුදල් ලබා දීමට ණය නියෝජිතායතනය එකඟ වී තිබූ අතර භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.මිලියන 1,670.86 ක් විය. ණය කාලසීමාව 2023 සැප්තැම්බර් 30 දින අවසන්වී තිබුණු අතර 2023 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 2,450.81 ක් හෙවත් සියයට 24.45 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මේ හේතුවෙන් අනුරාධපුර පූජා නගර සංවර්ධන ව්‍යාපෘතියේ පැකේජ 12 කින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි විය. | COVID 19 වසංගතය, ගෝලීය ආර්ථික අර්බුදය, දේශීය ආර්ථික ගැටලු සහ සියලු උද්ධමන හේතුවෙන් ව්‍යාපෘති සැලසුම් ක්‍රියාකාරකම් නිසි සැලසුම් ක්‍රමයට අනුව සිදු කිරීමට නොහැකි විය. | ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | කොන්ත්‍රාත්කරු විසින් කම්කරුවන් සහ යන්ත්‍ර සූත්‍රවල අක්‍රියභාවය සහ ආනුෂංගික වියදම් සඳහා අත්හිටුවීමේ හිමිකම් ලෙස රු.මිලියන 115 ක් ද, කාලය දීර්ඝ කිරීම සඳහා රු. මිලියන 69.93 ක මුදලක් ද ඉල්ලා ඇති අතර, එම පිරිවැය ව්‍යාපෘතිය අත්හිටුවීම හේතුවෙන් ව්‍යාපෘති පිරිවැයට බරක් විය. | විචලනයන් සහ අනෙකුත් තාක්ෂණික ගැටළු නිවැරදි කිරීමට දැනට කටයුතු කරමින් පවතී. කොන්ත්‍රාත්කරුවන්ගේ හිමිකම් මේ වන විට ඇගයීමට ලක් කරමින් පවතී. | අමතර වියදම් වළක්වා ගැනීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ව්‍යාපෘතිය අත්හිටුවීම හේතුවෙන් කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු. මිලියන 1,176 සිට රු. මිලියන 1,795 දක්වා සියයට 53 කින් වැඩිවී තිබුණු අතර එය සෘජුවම ශ්‍රී ලංකා රජයේ අරමුදලට බරක් වනු ඇත. | විචලනයන් සහ අනෙකුත් තාක්ෂණික ගැටළු නිවැරදි කිරීමට දැනට කටයුතු කරමින් පවතී. කොන්ත්‍රාත්කරුවන්ගේ හිමිකම් මේ වන විට ඇගයීමට ලක් කරමින් පවතී. | අමතර වියදම් වළක්වා ගැනීමට පියවර ගත යුතුය |
| (ඊ) | පැකේජ 01 යටතේ දුම්රිය ප්ලාසා සංවර්ධන ව්‍යාපෘතිය රු. මිලියන 98 ක වටිනාකමකින් නිම කර 2022 වර්ෂයේ දී දුම්රිය දෙපාර්තමේන්තුවට භාර දී ඇත. කෙසේ වෙතත්, අලුතින් ඉදිකරන ලද ආපනශාලාව 2023 දෙසැම්බර් 31 වන දින දක්වා නිසි නඩත්තුවක් නොමැතිකම හේතුවෙන් හිස්ව පැවතුණි. එබැවින් දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ දීර්ඝ කාලීන මෙහෙයුම් සහ නඩත්තු ගිවිසුමක් ඇති කර නොගැනීමෙන් දුම්රිය ප්ලාසා ගොඩනැගිල්ල අක්‍රියව පැවති බව නිරීක්ෂණය විය. | නඩත්තුව වැඩි දියුණු කිරීම සඳහා CGR වෙත දැනුම් දීමට අපි කටයුතු සම්පාදනය කරන්නෙමු, නමුත් ව්‍යාපෘතිය නිසි ලෙස ශ්‍රී ලංකා දුම්රිය වෙත පවරා ඇත. නඩත්තු කිරීමේ වගකීම ශ්‍රී ලංකා දුම්රිය සේවයට පැවරේ. | දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ දීර්ඝ කාලීන ගිවිසුමක් ඇති කර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (උ) | 2016 වසරේ ආරම්භ කරන ලද අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය 2023 සැප්තැම්බර් 30 වැනි දින නිම කිරීමට බලාපොරොත්තු වූ නමුත් එකඟ වූ ණය මුදල වන රු. මිලියන 10,025 න් රු.මිලියන 2,440 (සියයට 24)පමණක් 2023 දෙසැම්බර් 31 දක්වා භාවිතා කර ඇත. සවිස්තරාත්මක සැලසුම ඉදිරිපත් කිරීමට උපදේශක සමාගම වසර 02 ½ ක් ප්‍රමාද කිරීම එම තත්ත්වයට අහිතකර ලෙස බලපා තිබුණි. | COVID 19 වසංගතය, ගෝලීය ආර්ථික අර්බුදය, දේශීය ආර්ථික ගැටලු සහ සියලු උද්ධමන හේතුවෙන් ව්‍යාපෘති සැලසුම් ක්‍රියාකාරකම් නිසි සැලසුම් ක්‍රමයට සිදු කිරීමට නොහැකි විය. | නොපමාව සැලසුම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය |

## 3.4 පද්ධති සහ පාලන

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| අ) | වත්කම් හිමියන්ට පවරා දුන් ව්‍යාපෘති වත්කම්වල දිගුකාලීන තිරසාරභාවය සඳහා නිශ්චිත වත්කම් කළමනාකරණ සැලැස්මක් ව්‍යාපෘතිය විසින් සකස් කර නොතිබුණි. | වත්කම් ලැබීමෙන් පසු, දිගුකාලීන ස්ථාවරත්වය සඳහා වත්කම් කළමනාකරණ සැලැස්ම සකස් කිරීමට උපදෙස් දෙන ලදී. | වත්කම් කළමනාකරණ සැලැස්ම සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |
| ආ) | ව්‍යාපෘති මෙහෙයුම්වල අපේක්ෂිත ප්‍රතිලාභ සහ නිමැවුම මැනීම සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක ස්ථාපිත කර නොතිබුණි. | ප්‍රධාන කාර්ය සාධන දර්ශක ස්ථාපිත කර නොතිබුණි. | ප්‍රධාන කාර්ය සාධන දර්ශක ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |